සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education

පළමු වාර පරීක්ෂණය - 2018
1 st Term Test 2018

9 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය I,II
Citizen Ship Education - I , II

කාලය පැය : 2
Two hours

ඇතුලත් වීමේ අංකය : ................................ පන්තිය : .....................
නම : ...........................................................................................

## I කොටස

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**අංක 0 1 සිට 05 තෙක් ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 . සමාජයක මූලික තැනුම් ඒකකය වන්නේ
i. පාසල ii. පවුල iii. සමිති සමාගම් iv. ආගමික සිද්ධස්ථාන

02. ඇමරිකාවේ වහල්භාවය ව්‍යාප්ත කිරීමට විරුද්ධව සෘජුව ක්‍රියා කළ ශ්‍රේෂ්ඨ නායකයා කවුද?
i. මහත්මා ගාන්ධි ii. ඒබ්‍රහම් ලින්කන් iii. ඇරිස්ටෝටල් iv. මාඕ සේතුං

03. රටක තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන අහිතකර බලපෑමකි
i කාර්යක්ෂමතාවය වැඩිවීම ii. සම්පත් නාස්තිය අවම වීම
iii. මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම iv. ඵලදායිතාව වැඩි වීම

04. විදුලි බල්බය නිපදවනු ලැබුවේ
i. ඒබ්‍රහම් ලින්කන් ii. තෝමස් අල්වා එඩිසන් iii. ලොගී බෙයාඩ් iv. ලියනාඩෝ ඩාවින්චි

05. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක යුක්තිය පසිඳලීම ,පුරවැසි නිදහස හා මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කරදීමේ ප්‍රධාන කාර්ය සිදු කරන්නේ
i. පාර්ලිමේන්තුව ii. අධිකරණය iii. ජනාධිපතිවරයාය iv. ත්‍රිවිධ හමුදාවයි.

**අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශයන් හරි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

06. මර්සලින් පියකොඩි පියතුමා ආගම් අතර සහජීවනය ඇතිකිරීමට කටයුතු කළ බැවින් ඔහු ''පන්සලේ පියතුමා'' නමින් හැඳින්විණි. (.............)

07. සමාජයේ පවත්නා සියළුම රැකියා අවස්ථා ''රැකියා වෙළෙඳපොළ ''ලෙස හැඳින්වේ.(............)

08. ''සිරිත් මල්දම '' රචනා කරන ලද්දේ මාටින් වික්‍රමසිංහයන්ය. (............)

09. බටහිර ජාතීන්ගේ ආගමනයත් සමග වැවිලි කෘෂිකර්මය මෙරට ප්‍රචලිත විය (............)

10. ආර්ථිකයේ පවත්නා සම්පත් මිනිස් වුවමනා ඉටුකර ගත හැකි ආකාරයට වෙනස්කිරීම නිෂ්පාදනයයි. (............)

**අංක 11 සිට 15 දෙක්වා ප්‍රශ්නවලට "අ"කොටසට ගැලපෙන පිළිතුර "ආ" කොටසින් තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන තුළ යොදන්න.**

| අ | | ආ |
|---|---|---|
| 11. | රජයේ සියලුම නීතිමය කටයුතු සම්බන්ධව වගකීම දරන්නේ | A නීතිපති |
| 12. | සමාජ සුරක්ෂිතතාව ඇතිකිරීම සඳහා කටයුතු කරන ප්‍රධාන ආයතනයක් වන්නේ | B නීතිය |
| 13. | මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමේ නිර්දේශය ජනාධිපතිට ලබාදෙන්නේ | C පොලිසිය |
| 14. | රටක හෝ ජන සමාජයක සියලුම දෙනාම අවනත විය යුත්තේ | D නීතිපතිදෙපාර්තමේන්තුව |
| 15. | 119 සේවාව පවත්වාගෙන යාමෙන් හදිසි කරදර ,හදිසි අනතුරු සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වන ආයතනය | E ආරක්ෂක හමුදාව |

**අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(පුද්ගලයා,ශ්‍රී ලංකා යුධ හමුදාව ,පොලිසිය ,ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, සමථ මණ්ඩල කොමිෂන් සභාව )

16. සමථ මණ්ඩලය සඳහා සාමාජිකයන් පත් කරනු ලබන්නේ ........................................විසිනි.

17. 1996 අංක 21 දරන පනත මගින් ................................................ ස්ථාපිත කර ඇත.

18. සමාජ සුරක්ෂිතතාව ඇති කිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ ................................................ය.

19. සොර සතුරන්ගෙන් ,විවිධ අපරාධකරුවන්ගෙන් අප නිරතුරුව ආරක්ෂා කරන්නේ .. ..........................................යි.

20. ශ්‍රී ලංකාවට ගොඩබිමින් ආරක්ෂාව සැපයීම ...........................................ප්‍රධාන කාර්ය භාරයයි.

(ලකුණු 2 X 20 =40)

## II කොටස

පළමුවන ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. (i) දැනට ක්‍රියාත්මක වන අන්තර් ජාතික නීති දෙකක් නම් කරන්න.

(ii) සිවිල් නීතියට අයත් වැරදි දෙකක් ලියන්න.

(iii ) යහපත් පුරවැසියෙකු ලෙස සමාජයේ ජීවත්වීමට ආගමික සිද්ධස්ථානවලින් ඔබට ලබාදෙන උපකාරයන් 02ක් ලියන්න.

(iv) රටේ මූලික නීතිය ලෙස හැඳින්වෙන්නේ කුමක්ද ?

(v) සන්නිවේදනය සඳහා අතීතයේ භාවිතා කළ ක්‍රම 2ක් ලියන්න.

(vi ) සමුපකාර ව්‍යාපාරයේ පියා කවුද ?

(vii) අතීතයේදී භාවිතා කරන ලද ඉගෙනුම් උපකරණ දෙකක් ලියන්න.

(viii) ලංකාවට පමණක් ආවේණික ශාක වර්ග 2ක් නම් කරන්න.

(ix) බටහිර ජාතීන්ගේ පැමිණීමත් සමග මෙරට ව්‍යාප්ත වූ බෝග වර්ග දෙකක් නම් කරන්න

(x) වර්තමානයේ රෝගීන් පරීක්ෂාකිරීමට භාවිතා කරන නවීන යන්ත්‍ර දෙකක් නම් කරන්න.

(ලකුණු 2 X10 = 20 )

02. (i) සමාජ සුරක්ෂිතතාව තහවුරුවීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) රටක සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා දායක වන ආයතන 03 ක් නම් කරන්න.

(ලකුණු 03 යි )

(iii ) ''ඔබ කුමක් කලත් හොඳ කෙනෙක් වන්න.''යන ප්‍රසිද්ධ කියමන ඉදිරිපත් කළ ශ්‍රේෂ්ඨ නායකයා නම් කර ඔහු ජනතාව වෙනුවෙන් ඉටුකළ සේවාවක් විස්තර කරන්න.

(ලකුණු 05 යි )

03. (i) 18 වන සියවසේ ශ්‍රේෂ්ඨයකු බවට පත්වූ ''තෝමස් අල්වා එඩිසන් ''පිළිබඳ ගුරුවරයා විසින් මවට ලියා එවූ ලිපියේ සඳහන්ව තිබුයේ කුමක්ද ?. (ලකුණු 02 යි )

(ii) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි පාසලෙන් ඉටුවන කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි )

(iii ) ඔබගේ පාසල සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ඉටු කරන කාර්යයන්

මොනවාදැයි නිර්මාණාත්මකව ඉදිරිපත් කරන්න.

(ලකුණු 05 යි )

04. (i) නීතිය ක්‍රියාත්මක වන ආකාර අනුව ප්‍රධාන වශයෙන් වර්ග දෙකකි.එය නම් කරන්න.
(ලකුණු 02 යි )

(ii) අපරාධ නීතිය හා සම්බන්ධ වැරදි තුනක් පෙන්වා දෙන්න.
(ලකුණු 03 යි )

(iii ) නීතියේ මූලාශ්‍ර පහක් ලියන්න. (ලකුණු 05 යි )

05. (i) තාක්ෂණය යන්න සරලව හඳුන්වා දෙන්න. (ලකුණු 02 යි )

(ii) වර්තමානයේ තාක්ෂණය යොදා ගැනෙන අවස්ථා 03 ක් නම් කරන්න.
(ලකුණු 03 යි )

(iii ) තාක්ෂණික වෙනස්වීම් අවශ්‍ය වුවද මිනිසා විසින් බහුල ලෙස තාක්ෂණය භාවිතායට ගැනීම නිසා ඇති වී තිබෙන අහිතකර බලපෑම් 03 ක් දක්වා එයින් 02 ක් සමාජ අයහපතට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 05 යි )

06. (i) ''රටේ පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගනිමින් නාස්තිය අවම කරමින් සංවර්ධන ක්‍රියාවලිය සිදු කළ යුතුවේ ''

මේ සඳහා යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ 02ක් සඳහන් කරන්න.
(ලකුණු 02 යි )

(ii) ඕනෑම රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුනක් සඳහන් කරන්න.
(ලකුණු 03 යි )

(iii ) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේදී නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරන අවස්ථා පහක් දක්වන්න.
(ලකුණු 05 යි )

**I වාර පරීක්ෂණය 2018 9 -ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය**

I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1) පවුල | 6) ✓ | 11) D | 16) සමර් මණ්ඩල කොමිසන් සභාව |
| 2) ඒබ්‍රහම් ලින්කන් | 7) × | 12) E | 17) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන්සභාව |
| 3) මිනිස් අවශ්‍යතා සංකීර්ණ | 8) × | 13) A | 18) පුද්ගලයාට |
| 4) තොමස් අල්වා එඩිසන් | 9) ✓ | 14) B | 19) පොලිසියට |
| 5) අධිකරණය | 10)✓ | 15) C | 20) ශ්‍රී ලංකා යුධහමුදාව |

ii පත්‍රය සඳහා පිළිතුරු

01. (i) අන්තර් ජාතික මානව හිමිකම් නීතිය ,අන්තර් ජාතික සංක්‍රමණික නීතිය,අන්තර් ජාතික සාගර නීතිය,අන්තර් ජාතික පරිසර නීතිය, 9 -1 පාඩම ,12 වන පිටුව බලන්න.
(ii) පවුල් සබඳතා ,උරුමය ,අයිතිවාසිකම්,ඉඩම් ගැටළු,වන්දි යනාදි පිළිතුරු
(iii ) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පහදා දීම ,විනය හා ශික්ෂණය ඇති කිරීම
(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(v) අණ බෙරය ,හූ කීම ,දුමක් යැවීම
(vi) රොබට් ඕවන්
(vii) වැලි පීල්ල
(viii) ගොඩපර ,කොට්ටම්බා
(ix) තේ ,රබර්
(x) සී.ටී. ස්කෑන් ,X කිරණ

02. (i) නීතිරීති සම්ප්‍රදායන් පිළිගනිමින් ඒවාට ගරු කිරීම
(ii) පවුල ,පන්සල ,ආගමික ආයතන ,සමාජ ආයතන
(iii) ඒබ්‍රහම් ලින්කන් ඇමරිකාවේ වහල් භාවය ව්‍යාප්ත කිරීමට විරුද්ධ වීම
සමාජ සුරක්ෂිතතාව තහවුරු කල දූරදර්ශී නායකයෙකි.

03. (i) 9 ශ්‍රේණිය ,1 පාඩම ,5 පිටුව බලන්න.
(ii) 9 ශ්‍රේණිය ,1 පාඩම ,6 පිටුව බලන්න.
(iii ) දරුවා ලබාදෙන පිළිතුරට අවධානය යොමු කරන්න.

04. (i) 1.දේශීය නීතිය ,2. අන්තර් ජාතික නීතිය
(ii) මංකොල්ලකෑම ,ස්ත්‍රී දූෂණය ,ළමා අපයෝජන ආදිය
(iii) නීති විශාරද මත,සිරිත් විරිත් ,ආගම ,අධිකරණ තීරණ ,ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

05. (i) තම කටයුතු වඩා පහසු කර ගැනීම සඳහා මිනිසා යොදා ගන්නා ක්‍රම වේදය තාක්ෂණයයි
(ii) විවිද ගෘහ අවශ්‍යතා සඳහා ,විවිධ සේවා අවශ්‍යතා සඳහා ,විවේක හා විනෝද කටයුතු සඳහා ,නව නිපැයුම් බිහිකිරීම සඳහා .නිෂ්පාදන කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීම සඳහා ආදිය
(iii ) අහිතකර
මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම ,මිනිසුන් යාන්ත්‍රීකරණය වීම ,සමාජය සංකීර්ණ වීම,පරිසර දූෂණය වේගවත් වීම

06. (i) සම්පත් අපතේ යාම වැළකීම,ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි වීම,පරිසර හානිය අවම වීම,පාරිසරික තුල්‍යතාව රැකගත හැකි වීම,රටේ ආර්ථිකයට දරාගත හැකි වීම
(ii) නිෂ්පාදනය ,බෙදාහැරීම ,පරිභෝජනය
(iii ) බිම් සැකසීම .පැළ සිටුවීම ,අස්වනු නෙළීම ,රසායනික පොහොර යෙදීම ,පළිබෝධනාශක යෙදීම